## පළමුවන කියැවීම

1 සාමුවෙල් 1:20-22, 24-28

සාමුවෙල්ගේ පළමුවන පොතෙන් උපුටාගත් කොටසකි.

**ඔව්හු තම දරුවා සමිඳාණන්ට කැප කළෝ ය.**

හන්නා පිළිසිඳ ගෙන නියම කාලයේ දි පුත්‍රයකු ලැබුවා ය. ඈ ඔහුට සාමුවෙල් යන නාමය තැබුවා ය. "එසේ කළේ, මා සමිඳාණන් වහන්සේගෙන් ඔහු ඉල්ලාගත් බැවිනැ" යි ඈ කිවා ය. එල්කානා සහ ඔහුගේ මුළු පවුල අවුරුදු පතා කරන පූජාවත්, තමාගේ බාරයත් සමිඳාණන් වහන්සේට ඔප්පු කරන පිණිස ෂිලෝවට නික්ම ගියහ. එහෙත්, හන්නා ගියේ නැත, මන්ද, "ළමයා සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි හැම කල්හි ම නැවතී සිටින පිණිස කිරි වැරූ පසු ඔහු ගෙන යන තුරු මම නොයමි" යි ඈ ඇගේ පුරුෂයාට කීවා ය. දරුවා කිරි වැරූ පසු, හන්නා තුන් අවුරුදු වස්සෙකු ද පිටි කිලෝ ග්‍රෑම් දහයක් ද මිදියුෂ බඳුනක් ද අරගෙන දරුවා ගෙන ගොස් ෂිලෝහි තිබුණු සමිඳාණන් වහන්සේගේ මාළිගාවට පැමිණුනා ය. එකල ඔහු කුඩා දරුවෙකු ව සිටියේය. ඔව්හු ගොන් වස්සා මරා දරුවා ඒලි ළඟට ගෙනා හ. ඈ ඒලි අමතා, "අනේ ස්වාමීනි, මට සමාවන්න. වරක් ඔබ ළඟ සමිඳාණන් වහන්සේට යාච්ඤා කරමින් සිටි ස්ත්‍රිය මා බව මම දිවුරා කියමි. මේ දරුවා දෙන ලෙස මම යාච්ඤා කළෙමි. සමිඳාණන් වහන්සේ ද මා උන් වහන්සේගෙන් ඉල්ලූ මේ ඉල්ලීම මට ඉටු කළ සේක. එබැවින් මම ද ඔහු සමිඳාණන් වහන්සේට දෙන්නෙමි. ඔහු ජිවත්ව සිටින තෙක් සමිඳාණන් වහන්සේට කැප ය" යි කීවා ය. ඔව්හු එහි දී සමිඳාණන් වහන්සේට නමස්කාර කළහ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 84:1-2, 4-5, 8-9

පිළිතුර: සමිඳුන්ගෙ ගෘහයෙහි වසන්නෝ වාසනාවන්තයෝ ය.

ගීය: සව් බලැති දෙවිඳුනි, ඔබේ වාසභවනය කොතරම් මනහර ද? මසිත සමිඳුන්ගේ මන්දිරය දෙස දැවෙන ආශාවෙන් බලා සිටියි. මගේ ගත සිත ජිවමාන දෙවිඳුන්ට ප්‍රීතියෙන් ගී ගයයි.

ඔබේ ගෘහයෙහි වසන්නෝ කොපමණ වාසනාවන්ත ද? ඔව්හු ඔබේ පූජාසනය ළඟ නිරතුරු ඔබට පසස් ගී ගයනනෝ ය. වන්දනාවේ යන පිණිස සිත යොමු කර ගත්, ඔබ සරන කොට ගත් අය කොපමණ වාසනාවන්ත ද?

සමිඳුනි, සව් බලැති දෙවිඳුනි, මා අයැදුම ඇසුව මානව, අහෝ ජාකොබ්ගේ දෙවිඳුනි. මට සවන් දුන මැනව. අපේ පළිහ වන දෙවිඳුනි, බලනු මැනව. ඔබේ අභිෂේක ලත් තැනැත්තා දෙස කරුනා බැල්ම හෙළනු මැනව.

## දෙවන කියැවීම

1 ජුවාම් 3:1-2, 21-24

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටාගත් කොටසකි.

**අප දෙවියන් වහන්සේගේ දරුවෝ වෙමු.**

බලන්න, පියාණන් වහන්සේ අපට කොතරම් ප්‍රේම කර ඇද්ද? අප දෙවියන් වහන්සේගේ දරුවෝ යයි කියන තරමට උන් වහන්සේ අපට ප්‍රේම කළ සේක. ඇත්තෙන්ම අප උන් වහන්සේගේ දරුවෝ ම ය. ලෝකයා දෙවියන් වහන්සේ නොපිළිගන්නා බැවින්, ඔව්හු අප ද නොපිළිගන්නෝ ය. ප්‍රේමවන්තයෙනි, අපි දැනට

ම දෙවියන් වහන්සේගේ දරුවෝ ය. එහෙත් අනාගතයේ දී අප කොයි ආකාර අය වන්නෙමු දැ යි තව ම ප්‍රකාශ වී නැත. කෙසේ වෙතත් උන්වහන්සේ ප්‍රකාශ වන විට අපි උන් වහන්සේට සාමාන ව බව දනිමු. මන්ද, උන් වහන්සේගේ ප්‍රකෘති ස්වභාවයෙහි ම අපි උන් වහන්සේ දකින්නෙමු. ප්‍රේමවන්තයෙනි, අපේ සිත අපට දෝෂාරෝපණය නොකරයි නම්, දෙවියන් වහන්සේ ඉදිරියේ අපට බියවීමට කරුණක් නැත. තවද, අපි උන් වහන්සේගේ ආඥා පිළිපදින නිසා ද, උන් වහන්සේට ප්‍රියමනාප දේ කරන නිසා ද, උන්වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමු. උන් වහන්සේ ගේ ආඥාව නම්, උන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඇදහීමත්, උන් වහන්සේ අපට අණ කළ ලෙස එකිනෙකා ට ප්‍රේම කිරිමත් ය. උන් වහන්සේගේ ආඥා පිළිපදින්නා. උන් වහන්සේ තුළ වෙසෙයි. උන් වහන්සේ ද ඔහු තුළ වැඩවසන සේක. උන් වහන්සේ අප තුළ වැඩවසන බව අප දන්නේ උන් වහන්සේ අපට දුන් ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ලූක් 2:14

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේග් සාමය ඔබේ සිත් තුළ රජකම් කෙරේවා.
එතුමන්ගේ දහම් පණිවුඩය ඔබ තුළ සියළු ප්‍රඥාවෙන් පූර්ණව පවතීවා.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 2:41-52

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ජේසු කුමරුන් පඬිවරුන් මැද වැඩ හිඳිනු දුටුවෝය.**

ජේසුස් වහන්සේගේ මවුපියෝ අවුරුදු පතා පාස්කු උළෙල සඳහා ජෙරුසලමට ගියහ. උන්වහන්සේ දෙළොසැවිරිදි වූ කල ඔවූහු සිරිත් ලෙස ඒ මංගල්‍යයට ගියහ. ඔවුන් නියමිත දවස් ගෙවා පෙරළා එන අතර, ජේසු කුමරාණෝ ජෙරුසලමෙහි රැඳුණු සේක. එහෙත් උන් වහන්සේගේ දෙමවුපියෝ ඒ බව නොදැන, උන් වහන්සේ වන්දනාකාර පිරිස සමඟ ඇතැයි සිතාගෙන, දවසක ගමන් ගොස්, නෑ මිතුරන් අතරෙහි උන් වහන්සේ සෙවූහ. එහෙත් සම්භ නොවූයෙන්, ඔවූහු උන් වහන්සේ සොයමින් ජෙරුසලමට පෙරළා ගියහ. තෙදිනකට පසු ඔව්හු උන්වහන්සේ දේව මාලිගාවෙහි පඬිවරුන් මැද වැඩහිඳ ඔවුන් කී දේ අසමින් ද ඔවුන්ගෙන් ප්‍රශ්ණ විචාරමින් ද සිටිනු දුටුවෝය. ඒ ඇසූ සියල්ලෝම උන්වහන්සේගේ බුද්ධි මහිමය හා පිළිතුරු ගැන විස්මිත වූහ. දෙමව්පියෝ උන්වහන්සේ දුටු කළ මවිත වූහ. උන් වහන්සේගේ මෑණියෝ "පුතා කුමක් නිසා අපට මෙසේ කලෙහි ද? බලන්න, ඔබේ පියාද මම ද දුකින් තැවි තැවී ඔබ සෙවීමු" යි කීහ. එවිට උන් වහන්සේ පිළිතුරු දෙමින් "ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නහුද" යි ඔවුන්ට වදාළ සේක. එහෙත්, උන් වහන්සේගේ ඒ කීම ඔවුන්ට අවබෝධ නොවීය. උන්වහන්සේ ඔවුන් කැටුව ගොස් නාසරෙත් නුවරට පැමිණ ඔවුන්ට කීකරු වී විසූ සේක. උන්වහන්සේගේ මෑණියෝ මේ සියල්ලක්ම සිත්හි නිදන් කර ගත්හ. ජේසුස් වහන්සේ ප්‍රඥ මහිමයෙන් හා කාය ශක්තියෙන්ද, දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින්ද වැඩුණු සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.